**වීරකැටිය ප්‍රාදේශීය සභාව - 2023**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. අහිතකර මතය

වීරකැටිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම වන 1.6 ඡේදයේ ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන්, 2023 දෙසැම්බර් 31 දිනට වීරකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන්, අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල යුතු මුද්දර ගාස්තු ආදායම හා උසාවි දඩ ආදායම පිළිවෙලින් රු.33,162,825 ක් හා රු.1,434,657 ක් ද ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.1,138,588 ක් ද අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී ආදායම් නිවැරදිව ගිණුම්ගත කරන බව | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයන් තුළදී කඩ කාමර බදුදීමේදී අයකළ එක්වන් මුදල් රු.7,603,683 ක් සමුච්චිත අරමුදලට බැර නොකර කුලී ආදායමට බැරකර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කර ඇති බව | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ආයතනයේ ජංගම නොවන වත්කම් පිරිවැයට ගිණුම් තැබීමේ ප්‍රතිපත්තියෙන් බැහැරව මිලදී ගැණුම් පිරිවැය ඉක්මවා කැබ් රථයක් සමාලෝචිත වර්ෂයේදී තක්සේරු කර ගිණුම්ගත කර තිබීම නිසා මෝටර්රථ හා කරත්ත ගිණුමේ වර්ෂය අවසානයේ ශේෂය රු.2,500,000 ක් වැඩියෙන් දැක්වුණි. | ජර්නල් සටහන් යොදා නිවැරදි කර ඇති බව. | වත්කම් පිරිවැයට ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | තක්සේරු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.231,747 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කර ඇති බව | ගෙවිය යුතු ශේෂයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ඉකුත් වර්ෂයන් සඳහා ලැබිය යුතු එක්වන් මුදල් රු.200,000 ක් ගිණුම්ගත කිරීමේදී ලැබිය යුතු එක්වන් මුදල් ගිණුමට හර නොකර කුලී ආදායම් ගිණුමට හර කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කර ඇති බව | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ස්ථාවර තැන්පතු ගිණුමක් සඳහා ඉකුත් වර්ෂය වෙනුවෙන් ලද පොලී රු.116,863 ක් වර්ෂයේ පොලී ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කර ඇති බව | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | එකතු වටිනාකම රු.145,920 ක් වූ පාරිභෝජන ද්‍රව්‍ය අයිතම 56 ක් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ සහ ලී බඩු හා සවි කිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කර ඇති බව | තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | ස්ථිර කාර්යය මණ්ඩලය සඳහා ගෙවන ලද වැටුප් වෙනුවෙන් අඩුවෙන් ප්‍රතිපූර්ණය වූ රු.81,370 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කර ඇති බව | ලැබිය යුතු ශේෂයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග ලෙස ලද එකතු වටිනාකම රු.85,218 ක් වූ ලීටර් 1000 ජල ටැංකි 07 ක් පාරිභෝජන ද්‍රව්‍ය තොගය යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කර ඇති බව | පරිත්‍යාග නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම්

| නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/උප ලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.1,211,153 ක වෙනසක් පැවතුණි. | වෙනස හඳුනා ගැනීමට කටයුතු කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ 20 වගන්තිය | 2002 හා 2014 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අයකිරීම නිසා තක්සේරුව කාලීනව ක්‍රියාත්මක නොවූ කාලය පිළිවෙලින් වර්ෂ 16 ක් හා 04 ක් විය. | 2020 වර්ෂයේදී ලද වීරකැටිය තක්සේරු වාර්තාව ක්‍රියාත්මක කිරීම සඳහා විරෝධතා පරීක්ෂණයක් පැවැත්වීමට තක්සේරු දෙපාර්තමේන්තුව අවස්ථාවක් ලබාදී නොමැති බවත්, වලස්මුල්ල වරිපනම් බල ප්‍රදේශයට අදාළ නව තක්සේරුව ලැබුණු පසු ක්‍රියාත්මක කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු) 2021 ජනවාරි 01 දිනැති අංක 4/04/01/2021 දරන චක්‍රලේඛයේ(ආ) 6 වගන්තිය | වොරන්ට් බලපත්‍රයේ සඳහන් හිඟ වරිපනම් බදු වටිනාකම සැලකිල්ලට නොගෙන සමාලෝචිත වර්ෂයේදී ආදායම් පරීක්ෂක, දේපල තහනම් කිරීමේ නිලධාරී හා සභා ලේකම් වෙත 2023 වර්ෂයේ කාර්තුමය හිඟ ලැයිස්තු ලේඛනයන්ට අදාළව එකතු කළ මුදලින් සියයට 10 ක් හා සියයට 03 ක් ලෙස කොමිස් මුදල් ලෙස රු.181,933 ක් 2023 නොවැම්බර් මස දක්වා ගෙවීම් කර තිබුණි. | කොමිස් මුදල් ගෙවීමේදී අදාළ හිඟ මුදල් අයකළ දිනයන්, රාජකාරී වේලාවෙන් බැහැර වූ නිවාඩු දිනයන් බව තහවුරු කරගනිමින් ගෙවීම් කළ බව. | යොමුගත චක්‍රලේඛයප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.41,185,943 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,592,388 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,835,000 | 3,744,817 | 4,907,714 | 4,356,197 | 3,284,000 | 3,857,349 | 4,348,772 | 5,519,094 |
| කුලී | 31,582,600 | 62,201,239 | 72,307,611 | 8,632,978 | 19,749,000 | 27,392,546 | 25,770,069 | 18,739,350 |
| බලපත්‍ර ගාස්තු | 2,155,000 | 3,320,755 | 3,494,147 | 390,083 | 1,200,000 | 2,667,535 | 2,527,305 | 563,475 |
| වෙනත් ආදායම් | 14,523,000 | 15,985,664 | 15,971,775 | 13,889 | 4,965,500 | 10,308,815 | 10,308,815 | - |
| **එකතුව** | **52,095,600** | **85,252,475** | **96,681,247** | **13,393,147** | **36,009,350** | **44,226,245** | **42,954,961** | **24,821,919** |

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් ඒකක 2316 කින් ලැබිය යුතු බදු රු.4,095,480 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු.368,627 ක් අයකර ගත් බවත්, ඉතිරි හිඟ මුදල් අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ) | ව්‍යාපාර ඒකක 85 කින් ලැබිය යුතු බදු රු.193,200 ක් හා පොල බදු රු.6,933,130 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපාර බදු හිඟයෙන් රු.21,600 ක් අයවී රු.6,000 කට නඩු පවරා ඇති බව හා පොල බදු රු.259,750 ක් අයකර රු.4,812,239 ක් සඳහා නඩු පවරා ඇති බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | සභාව සතු කඩ කාමර 19 කින් ලැබිය යුතු කඩ කුලී රු.130,319 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු.102,519 ක් අයකර ගත් බවත්, රු.23,800 ක් කපා හැරීමට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඈ) | යන්ත්‍රෝපකරණ කුලියට දීමෙන් ලැබිය යුතු රු.1,569,529 ක් හා දැන්වීම් පුවරු ඒකක 15 කින් ලැබිය යුතු ගාස්තු රු.320,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | යන්ත්‍රෝපකරණ කුලී රු.1,156,000 ක් අයකර ගත් අතර ඉතිරිය කපා හැරීම සඳහා ආණ්ඩුකාරවරයා වෙත යොමු කළ බව හා දැන්වීම් පුවරු ගාස්තු රු.210,000 ක් අයකර ඉතිරි හිඟයන් නඩු තීන්දු පරිදි අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතු උසාවි දඩ රු.1,297,060 ක් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබූ අතර හිඟ ශේෂය තුළ වසර 03 ඉක්මවූ ශේෂය රු.296,069 ක් විය. | රු.1,000,991 ක් අයකර ගත් බවත්, ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට අනුමත කර තිබූ ගොඩනැගිලි සැලසුම් 05 කට අදාළව අනුමත ප්‍රමාණය ඉක්මවා කළ ඉදිකිරීම් වෙනුවෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතට 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් කරනු ලැබූ සංශෝධන අනුව අයකළ යුතු රු.756,618 ක ආවරණ අනුමැතිය ලබාදීමේ ගාස්තු අයකර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති ගාස්තු අයකිරීමට කටයුතු කරන බව.. | පනතේ හා සංශෝධිත ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | රු.42,506 ක ගාස්තුවක් ගෙවා අනුකූලතා සහතිකය ලබා නොගෙන ව්‍යාපාරික ආයතනයක් ගොඩනැගිල්ල ඉදිකර ව්‍යාපාර කටයුතු සිදුකරන බවට නිරීක්ෂණය විය. | සංශෝධිත සැලැස්ම සඳහා අනුමැතිය ලබාදීමෙන් පසු අනුකූලතා සහතිකය නිකුත් කර ගාස්තු අයකිරීමට කටයුතු කරන බව. | අනුකූලතා සහතිකය ලබාදීමට සහ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වීරකැටිය පොදු වෙළඳපොල බදුගත් බදුකරු විසින් 2007 වර්ෂය සඳහා ගෙවිය යුතු රු.820,558 ක් නොගෙවීම මත බදුකරුට එරෙහිව පවරන ලද නඩුවට අදාළ 2019 නොවැම්බර් 28 දිනැති නඩු තීන්දුව අනුව හිඟ බදු මුදල සහ නීතිඥ ගාස්තු සමග බදුකරුගෙන් අයකර ගත යුතු වුවත්, තීන්දුව ලැබී වර්ෂ 04 ක් ගතවී තිබුණද එකී මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ පොළ බදු මුදලට අදාළ බිල්පත නිවැරදිව සකස් කර අධිකරණය වෙත ඉදිරිපත් කර හිඟ බදු හා නීතිඥ ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබූ කර්මාන්ත 16 ක් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා නොගැනීම නිසා සභාවට ලැබිය යුතු රු.79,200 ක පරිසර බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි. | කර්මාන්ත 06 ක් සඳහා පරිසර බලපත්‍ර නිකුත් කර ඇති අතර, ඉතිරි කර්මාන්ත සඳහා පරිසර බලපත්‍ර ලබාගන්නා ලෙස ලිඛිතව දැනුවත් කළ බව | ව්‍යාපාර ආයතන පරිසර බලපත්‍ර ලබාගැනීමට උනන්දු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව භුක්ති විඳින වාහන හා යන්ත්‍ර උපකරණ 03 ක ඉඩම් හා ගොඩනැගිලි 17 ක හා සුසාන භූමි 12 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන සහ ඉඩම් ගොඩනැගිලි හා සුසාන භූමි මැනුම් කටයුතු අවසන් වූ වහාම පවරා ගැනීමට කටයුතු කරන බව. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

### 3.4 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට වාර්ෂික අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන වෙන් කර තිබූ එකතු වටිනාකම රු.7,018,718 ක් වූ සංවර්ධන යෝජනා 82 ක් වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රමුඛතාවය අනුව කර්මාන්ත 04 ක් ක්‍රියාත්මක කළ බව. | අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර තිබූ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.5 ප්‍රසම්පාදන කළමණාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 වගන්තිය අනුව ප්‍රසම්පාදනයකදී අවම වශයෙන් සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුක්ත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කළ යුතු වුවත්, වීරකැටිය හෙලබොජුන්හල සඳහා රු.457,065 ක් වූ ආරක්ෂිත කැමරා පද්ධතිය සවිකිරීමට අදාළව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර වාර්තාවක් ලබාගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 (අ) වගන්තිය අනුව ප්‍රසම්පාදනය කිරීමට ඇති භාණ්ඩ හෝ වැඩ සඳහා පිරිවිතර අදාළ ප්‍රසම්පාදන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍යා ප්‍රමාණයට වඩා පටු ආකාරයට විස්තර නොකළ යුතු වුවත්, එකතු වටිනාකම රු.495,730 ක් වූ මිලදී ගැනීම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11 සහ ගාල්ල පළාත් ඉංජිනේරුසේවා කාර්යාලයේ විදුලි අධිකාරීවරයා නිකුත් කර ඇති පළාත් පාලන ආයතනවල මාර්ග ආලෝකන පහන් ස්ථාපනය හා නඩත්තුවට අදාළ මාර්ගෝපදේශයේ අංක 09 ඡේදය අනුව වීථි පහන් කට්ටල මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවක නිර්දේශ ලබාගත යුතු වුවත් එපරිදි කටයුතු නොකර රු.780,000 ක වීථිපහන් කට්ටල 30 ක් මිලදීගෙන තිබුණි. | තාක්ෂණ සේවයේ නිලධාරියෙකුගෙන් සමන්විත ටෙන්ඩර් කමිටුව විසින් ලබාදී ඇති නිර්දේශ පරිදි වීථි පහන් කට්ටල මිලදී ගත් බව. | යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා මාර්ග ආලෝකන පහන් ස්ථාපනය හා නඩත්තුවට අදාළ මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව සහ 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු සඳහා යන්ත්‍ර සහ ට්‍රැක්ටර් රථ භාවිතය වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා මිලගණන් කැඳවීම් නොකර රු.4,907,530 ක් සභා තීරණයක් මත පදනම්ව ගෙවීම් කර තිබූ අතර ග්‍රාමීය මාර්ග සහ ක්‍රීඩාපිටි වල සිදුකළ යුතු සංවර්ධන කටයුතු මොනවාද යන්න හඳුනාගෙන ගෙවීම් කිරීම සඳහා කාර්මික නිලධාරී විසින් නිම්වැඩ වාර්තා සකස් කර නොතිබුණි. | සභා තීරණය පරිදි දිස්ත්‍රික් මිල කමිටු මිල ගණන් අනුව ට්‍රැක්ටර් රථ සඳහා ගෙවීම් කළ බවත්, නිම් වැඩ වාර්තාවල වටිනාකම් පදනම් කරගෙන ගෙවීම් කළ බව. . | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව සහ ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, නිම්වැඩ වාර්තා සකස් නොකර ගෙවීම් නොකළ යුතුය. |
| (ආ) | 2023 සැප්තැම්බර් මස නිකුත් කර තිබූ මාර්ග මිල ගණන් ලේඛනයේ සඳහන් මිල ගණන් අනුව කුලී පදනම මත ලබාගත් මෝටර් ග්‍රේඩරය සහ බැකෝ ලෝඩර් යන්ත්‍රය සඳහා ගෙවීම් නොකර සභා තීරණයක් මත පදනම්ව ගෙවීම් කිරීම නිසා රු.412,836 ක් වැඩිපුර සභා අරමුදලින් ගෙවා තිබුණි. | 2022 වර්ෂයේ සැප්තැම්බර් මස සභා තීරණ අංක 7.18 යටතේ ජේ.සී.බී. හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර සඳහා ගෙවීම් කළ බව. | වැඩිපුර කල ගෙවීම් අයකර ගත යුතුය. |
| (ඇ) | ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කොන්ක්‍රීට් කැටගල් අල්ලා සංවර්ධනය කර තිබූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 07 කට අදාළව කැටගලක් රු.35 ක් හා රු.37 ක් යන මිලගණන් වලට කොන්ත්‍රාත්කරුවන් විසින් මිලදීගෙන තිබියදී එම මිලගණන් පදනම් කර නොගෙන රු.43.13 ක් සහ රු.47.40 ක් බැගින් ගෙවීම් කර තිබීම නිසා එකතුව රු.460,396 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කළ ඇස්තමේන්තුවල සඳහන් මිල ගණන් අනුව ගෙවීම් කළ බව. | වැඩිපුර කල ගෙවීම් අයකර ගත යුතුය. |
| (ඈ) | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 02 කට අදාළව කොන්ත්‍රාත්කරුවන් විසින් මාර්ග ඉදිකිරීම සඳහා මිලදීගෙන තිබූ කොන්ක්‍රීට් කැටගල් ප්‍රමාණය ඉක්මවා ගෙවීම් කිරීම නිසා රු.62,896 ක් වැඩිපුර ගෙවා තිබුණි. | කැටගල් ඇතිරූ වර්ග මීටර් ප්‍රමාණය අනුව ගණනය කිරීම් කර මුදල් ගෙවීමක් කළ බව. | වැඩිපුර කල ගෙවීම් අයකර ගත යුතුය. |

### 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිවෙලින් 83 ක් හා 91 ක් වූයෙන් තනතුරු 08 කට අදාළ අතිරික්තතා 21 ක් සම්පූර්ණ කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | අතිරික්ත සේවකයන් අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය අනුව තොරතුරු කැඳවීම් කළ බව. | කාර්ය මණ්ඩලයේ අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වර්ෂයට හිමි නිවාඩු දින 45 ඉක්මවා සභාවේ සේවකයන් දෙදෙනෙකු 2022 වර්ෂයේදී සහ සේවකයන් දස දෙනෙකු 2023 වර්ෂයේදී ලබාගෙන තිබූ නිවාඩු දින වෙනුවෙන් වැටුපෙන් අයකරගත යුතු පිළිවෙළින් රු.6,612 ක් හා රු.75,977 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළ හිඟ මුදල අයකරගත් බවත්, 2023 වර්ෂයට අදාළ හිඟයෙන් රු.42,109 ක් අයකර ගත් බවත්, ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | වැටුප් ලෙස වැඩිපුර කළ ගෙවීම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | 2019 ජුනි 27 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව සභාවේ සේවය කර සේවය හැරගිය සහ වැඩ තහනමට ලක්වූ සේවකයින් හයදෙනෙකුගෙන් ලැබිය යුතු රු.95,402 ක ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟයෙන් රු. 5,000 ක් අයකර ගත් අතර ඉතිරි සේවක ණය අයකර ගැනීමට කටයුතු කරන බව. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |